

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290

උපරිමාධිකරණ විනිශ්චයකාරවරු

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்: 290

உயர்நீதிமன்ற நீதியரசர்கள்

Parliamentary Series No :290
Judges of the Superior Court

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290

ආයතනයේ නම : උපරිමාධිකරණ විනිශ්චයකාරවරු

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

පාරාළුමන්ර වෙළියීට්ටුත් තොටර් ඉලක්කම්: 290

නිරුවනත්තින් පෙයර්: උයර්නීතිමන්ර නීතියරසර්කළ්

පාරාළුමන්රත්තින් අරස කණක්කුක් කුළුවිනාල් මුන්වෙක්කප්පට්ට අරික්කෙ තොටර්පාක නිලෙයියර් කට්ටළෙ ඉලක්කම් 119(4)ඉන් කීළ් නිරුවනඞ්කළිර්කුප් පොරුප්පාන කෙළරව අමෙච්චරින් අවතානිප්පුක්කළුම් මර්රුම් අතු තොටර්පාක එටුක්කප්පටුම් නටවටික්කෙකළුම් පාරාළුමන්රත්තිර්කු සමර්ප්පිත්තල්.

Parliamentary Series No : 290

Name of the Institution : Judges of the Superior Courts

Submission of observations of the Hon.Minister in Charge of the Institutions and steps taken With regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No . 119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 290

ආයතනයේ නම - උපරිමාධිකරණ විනිශ්චයකාරවරු

2021 මුදල් වර්ෂය

	කමිටුව මගින් හඳුනා ගත් දුර්වලතා	දුර්වලතා මග හරවා ගැනීම සඳහා ආයතනය මගින් ගත් පියවර/වර්තමාන තත්ත්වය
01	බඩු ලේඛණ පොත යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.	2024 වර්ෂය වන විට බඩු ලේඛණ පොත යාවත්කාලීනව පවත්වා ගැනීමට පියවර ගෙන ඇත.
02	2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මෘදුකාංගයට අදාල පළමු, දෙවන් හා තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස්කර නොතිබුණි.	මේ වන විට 171/2004 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව මුර පද වෙනස් කිරීමට පියවර ගෙන ඇත.
03	සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	පවරා ගැනීමට කටයුතු කරමින් පවතින අතර දැනට අධිකරණ අමාත්‍යාංශය මගින් පවත්වාගෙන යයි.
04	සෑම වාහනයක් සඳහාම වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර නොතිබුණි.	මේ වනවිට යාවත්කාලීන කර ඇත.
05	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව කටයුතු කිරීම දැනටමත් ආරම්භ කර ඇත.
06	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව විශේෂිත වියදම් ඒකකය සතු වාහනවල ඉන්ධන දහනයවීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	සංචිත වාහන නොමැති අතර, ගරු විනිසුරුතුමන්ලාහට ඉන්ධන දීමනාවක් පමණක් ලබාදේ.
07	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	2023 වර්ෂයේ සිට නිසි පරිදි නිරවුල් කිරීමට කටයුතු කර ඇත.
08	කාර්ය මණ්ඩලයේ සියළුදෙනා වෙත ලිඛිත කාර්ය පැවරුම් කර නොතිබුණි.	අදාල නොවේ.

09	2017.09.20 දිනැති අංක 04/2017 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල තොරතුරු සෑම කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.	අදාල නොවේ.
10	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව 2018.08.01 දිනෙන් පසුව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැත.
11	මු.රෙ.134(2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩ සටහන වර්ෂය ආරම්භයේ දී පිළියෙල කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැති බැවින් අදාල නොවේ.

05.02.2024 වන දින,
ශ්‍රේෂ්ඨාධිකරණයේදීය.

රෙජිස්ට්‍රාර්
ශ්‍රේෂ්ඨාධිකරණය

අරවින්ද ගුණරත්න
අතිරේක මහේස්ත්‍රාත්
රෙජිස්ට්‍රාර්
ශ්‍රේෂ්ඨාධිකරණය
කොළඹ 12.

<u>පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 290</u>

<u>ආයතනයේ නම - උපරිමාධිකරණ විනිශ්චයකාරවරු</u>

<u>2021 මුදල් වර්ෂය</u>

	කම්ටුව මගින් හඳුනා ගත් දුර්වලතා	දුර්වලතා මග හරවා ගැනීම සඳහා ආයතනය මගින් ගත් පියවර/වර්තමාන තත්ත්වය
01	ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිළි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	අදහස් සන්නිවේදනය සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙබ් අඩවිය මගින් ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් , නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ධුර සඳහා අදාළ දුරකථන අංක හා විද්‍යුත් ලිපින මහජනතාව වෙත දන්වා ඇත. ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය අධිකරණ කටයුතු හා සම්බන්ධ බැවින් ,වෙබ් අඩවියට පිවිසෙන සෑම අයකුටම දැකගත හැකි පරිදි වෙබ් අඩවියේ යම් හෙයකින් යම් සාවද්‍ය හා අපහාසාත්මක අදහස් ප්‍රකාශ කිරීම අධිකරණයේ ගරුත්වයට හා ක්‍රියාකාරීත්වයට් හානි කර බැවින් ,ප්‍රසිද්ධ අදහස් දැක්වීම සඳහා අවස්ථාවක් සකස් කර නැති බව සඳහන් කරමි.
02	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	2023 වර්ෂය වන විට අඩුපාඩු හැකිතාක් දුරට අවම කිරීමට කටයුතු යොදා ඇත.
03	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	ගරු අගවිනිසුරුතුමා ඇතුළු උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන් පත්කරනු ලබන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපතිතුමා විසිනි. ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාට ඒ සඳහා කටයුතු කළ නොහැක.
04	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	දෛනික අධිකරණ රාජකාරි වලට බාධාවක් නොවන පරිදි ගරු අගවිනිසුරුතුමාගේ උපදෙස් ප්‍රකාරව පුහුණු අවස්ථා ලබා දී ඇත.එම අවස්ථා වැඩි දියුණු කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.
05	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම් ගතව නොතිබුණි.	අදාල නොවේ.
06	මානව සම්පත් සංවර්ධන සැළසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාක්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම්කර නොතිබුණි.	දෛනික අධිකරණ රාජකාරි වලට බාධාවක් නොවන පරිදි ගරු අගවිනිසුරුතුමාගේ උපදෙස් ප්‍රකාරව සිදු වේ.

07	ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි.	ශ්‍රේෂ්ඨාධිකරණ දෙපාර්තමේන්තුව සඳහා තිරසර අරමුණු හා කාර්ය සාධන ඉලක්ක හඳුනාගැනීමක් සිදුකර ඇති අතර ,ගරු උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ විෂය පථය අනුව තිරසර අරමුණු වැදගත් වන්නේ කෙසේද යන්න සලකා බලා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.
08	හඳුනාගත් තිරසර අරමුණු ඉලක්ක ලභාකර ගැනීම මැන බැලීම සඳහා කාර්ය සාධන ඉලක්ක නියම කර නොතිබුණි.	ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව සඳහා තිරසර අරමුණු ඉලක්ක ලභා කර ගැනීම මැන බැලීම සඳහා කාර්ය සාධන ඉලක්ක නියම කර ඇතත්, ගරු අගවිනිසුරුතුමා ඇතුළු උපරිමාධිකරණ විනිසුරුවරුන් සඳහා එසේ කිරීම ප්‍රායෝගිකව අපහසුය .
09	හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව සඳහා හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර ඇතත්,ගරු උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ විෂය පථය අනුව දර්ශක නියම කිරීම ප්‍රායෝගිකව අපහසුය .
10	සැළසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	දෛනික අධිකරණ රාජකාරි වලට බාධාවක් නොවන පරිදි ගරු අගවිනිසුරුතුමාගේ උපදෙස් ප්‍රකාරව පුහුණු අවස්ථා ලබා දී ඇත.එම අවස්ථා වැඩි දියුණු කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.
11	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන විට විගණන නිර්දේශ ක්‍රියාත්මක කරමින් පවතී.
12	2020.08.28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටුකල යුතු කාර්ය භාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්ය සාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි.	අදාල නොවේ.
13	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	අදාල නොවේ.

05.02.2024 වන දින ,
ශ්‍රේෂ්ඨාධිකරණයේදීය.

රෙජිස්ට්‍රාර්
ශ්‍රේෂ්ඨාධිකරණය.

අරවින්ද ගුණරත්න
අතිරේක මහේස්ත්‍රාත්
රෙජිස්ට්‍රාර්
ශ්‍රේෂ්ඨාධිකරණය
කොළඹ 12.